චක්‍රලේඛ අංක :- 2019/01

මගේ අංකය :- EC/ADM/EL/1/ST.
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2019.08.05

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අනෙකුත් ව්‍යවස්ථාපිත කොමිෂන් සභාවල ලේකම්වරුන්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන්

**මැතිවරණ කාර්යයන් සඳහා රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ තොරතුරු රැස් කිරීම**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම් සඳහා රාජ්‍ය සේවයේ සියලුම නිලධරයන් හා සේවකයන්ගේ සහාය ලබා ගැනීමට අපේක්ෂිතය. එලෙස නිලධරයන් හා සේවකයන් මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ සියලුම නිලධරයන් සම්බන්ධයෙන් සහ සංස්ථා හා මණ්ඩල සඳහා ද්විතීයනය කර ඇති රජයේ නිලධරයන් සම්බන්ධයෙන් සංගණනයක් කළ යුතුව ඇත. මෙම සංගණනයට අදාළ දත්ත පත්‍ර (COPEC-F1 හා COPEC-F2) හා එම දත්තපත්‍ර වලට අදාළ සංගණන සාරාංශ පත්‍ර (COPEC-F3) මෙම චක්‍රලේඛය සමඟ යා කර ඇති අතර (පිළිවෙලින් ඇමුණුම 1, 2 හා 3), එම ආකෘති මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ද (www.elections.gov.lk) බාගත හැකිය.

- **COPEC-F1** - ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයා ඇතුළු සහකාර තේරීම්භාර නිලධරයන් හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (පිරිමි) නිලධරයන් සඳහා වූ සංගණන ආකෘතිය [ARO/(M/F)), SPO(M)]
- **COPEC-F2** - ඡන්ද විමසීම්වලදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (කාන්තා)/ කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා ලිපිකරු නිලධරයන් සඳහා වූ සංගණන ආකෘතිය [SPO(F)/ JPO (M/F), CL (M/F]
- **COPEC-F3** - නිලධාරි සංගණන සාරාංශ ආකෘතිය

02. මධ්‍යම රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු, ස්ථිර පත්වීම් දරන සියලුම නිලධරයන් හා විදුහල්පතිවරුන් මෙන්ම ගුරුවරුන් මැතිවරණ රාජකාරිවල යෙදවීම පිණිස මැතිවරණ කොමිෂන් සභාවට ඔවුන්ගේ තොරතුරු ලබාදීම අත්‍යවශ්‍යය. ඡන්ද විමසීම් පැවැත්වෙන දින හා එයට ආසන්නතම දින කිහිපය තුළ දී රජයේ කාර්යාලවල සාමාන්‍ය කටයුතු අවශ්‍යයෙන්ම තාවකාලිකව අත්හිටුවීමට සිදුවන අතර, ඡන්ද විමසීම සාර්ථකව පවත්වනු පිණිස අත්‍යවශ්‍ය සේවාවන් සඳහා යෙදවිය යුතු වන නිලධාරීන්ගේ සංඛ්‍යාව ද දැඩි ලෙස සීමා කළ යුතුව පවතී. එවැනි අත්‍යවශ්‍ය සේවාවන්හි යෙදවිය යුතු නිලධරයන් මැතිවරණ රාජකාරිවලින් නිදහස් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ඡන්ද විමසීම ආසන්නයේ දී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ඇත.

03. මැතිවරණ රාජකාරී කටයුතුවල නිරත වීම නිසා තම තමන්ට නියමිත ඡන්ද පොළට ගොස් පෞද්ගලිකව ඡන්දය දීමට නොහැකි වන සියලුම රජයේ නිලධරයන්ට තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසාලන විධිවිධාන අදාළ ඡන්ද විමසීම් පනත්වලට ඇතුළත් කර ඇත. තැපැල් ඡන්ද පහසුකම් සඳහා අයදුම් නොකිරීම හෝ නිවැරදි තොරතුරු සැපයීමට අපොහොසත්වීම හෝ අයදුම්පත් ප්‍රමාදවී ඉදිරිපත් කිරීම හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප වීම හෝ මැතිවරණ රාජකාරීවලින් නිදහස් වීමට හේතුවක් නොවන බව ආයතන ප්‍රධානීන් විසින් අදාළ සියලුම නිලධරයන්ට අවධාරණයෙන්ම දැනුම් දිය යුතුය. ජනරජයෙන් වැටුප් ලබන කිසිදු රජයේ නිලධරයෙකුට/ සේවකයෙකුට මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව මැතිවරණ රාජකාරීවලින් බැහැර වීමට හැකියාවක් නැති බව අවධාරණය කරනු ලැබේ.

04. අදාළ ආයතන ප්‍රධානියා විසින් මැතිවරණ රාජකාරිවලින් නිදහස් කිරීමක් නිශ්චිතවම නිර්දේශ කරනු ලැබීමෙන් පසු මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ රාජකාරිවලින් නිදහස් කළහොත් හැර, සෑම රජයේ නිලධරයකුගේම සේවය මැතිවරණ රාජකාරි සඳහා ලබාගත හැකි යැයි සළකනු ලැබේ. ආයතන ප්‍රධානියාගේ අදහසේ හැටියට ප්‍රමාද කළ නොහැකි කිසියම් අත්‍යවශ්‍ය රාජකාරියක යෙදවීමට සිදුවන නිසා හෝ නිලධරයකුගේ පෞද්ගලික හේතුවක් මත (උදා: තදබල අසනීප, ගර්භනී, පශ්චාත් ප්‍රසූති හෝ එවන් විශේෂිත) හෝ යම් නිලධරයකුගේ සේවය මැතිවරණ රාජකාරි කටයුතු සඳහා ලබාදීමට නොහැකි වන්නේ නම්, ඊට අදාළ සනාථ කිරීම් ලේඛන සමඟ අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේවුවද වුවත් රජයේ නිලධරයන් මැතිවරණ රාජකාරිවලින් නිදහස් කිරීමේ බලය මුළුමනින්ම මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරෙන බව ද සැලකුව මැනවි.

05. පහත ගණයන්ට අයත් වන නිලධරයන් හැර, ඔබ කාර්යාලයේ/ පාසලේ සිටින ස්ථිර පත්වීමක් සහිත සියලුම නිලධරයන්/ විදුහල්පතිවරුන්/ ගුරුවරුන්, ස්ත්‍රී/ පුරුෂ භේදයකින් තොරව මැතිවරණ රාජකාරිවල නිරත කරවීමට අපේක්ෂිතය.

**i.** **කැබිනට් සහ රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන් හෝ ඒ හා සමාන තනතුරු දරන නිලධරයන්**

**ii.** **ඡන්ද විමසීම් රාජකාරි සඳහා දුර බැහැර ගමන් කිරීමට අපහසු හෝ ඡන්ද විමසීම් රාජකාරි ඉටු කිරීමට අපහසු තරම් ආබාධිත තත්ත්වයෙන් පසුවන නිලධරයන්**

**iii.** **මෙම චක්‍රලේඛය නිකුත් වන දින සිට මාස 06 ක කාලය තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත නිලධරයන්**

**iv.** **බෞද්ධ භික්ෂූන් වහන්සේලා හා වෙනත් ආගමික පූජකවරුන්**

**v.** **ගර්භනී අවස්ථාවේ පසුවන හා මව්කිරි බොන ළදරුවන් සිටින නිලධාරිනියන් හා මැතිවරණ රාජකාරිවල යෙදවීමට නොහැකි තරම් බරපතල අසනීප තත්ත්වයේ පසුවන නිලධරයන්**

ඉහත කාණ්ඩවල නිලධරයන් හැර සෙසු නිලධරයන් මැතිවරණ රාජකාරිවලින් නිදහස් කරවා ගැනීම පිණිස අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ද සමඟ ලිඛිත ඉල්ලීම් මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

06. ස්ත්‍රී/ පුරුෂ භේදයකින් තොරව සියලුම නිලධරයන්/ විදුහල්පතිවරුන්/ ගුරුවරුන් ලවා මෙම ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කර ඇති බවට නිසැකවීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ. ඒ අනුව 2019 අගෝස්තු මස වැටුප් ලේඛනයේ නම් ඇතුළත්ව තිබූ සියලුම නිලධරයන් ලවා නිලධාරී සංගණන ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කරවීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරෙන අතර එසේ සම්පූර්ණ කරන ලද ආකෘතිපත්‍ර සමඟ 2019 අගෝස්තු මස වැටුප් ලේඛනයේ නම් ඇතුළත්ව තිබූ සියලුම නිලධාරීන්ගේ නාමලේඛනයක් ද එහි නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් පෞද්ගලිකවම අත්සන් තබා සහතික කිරීමෙන් අනතුරුව මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය.

07. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නිලධරයන් වෙනත් කාර්යාලවලට අනුයුක්ත කර ඇති විටදී එවැනි නිලධරයන්ගේ තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ අනුයුක්ත කර ඇති කාර්යාල හරහාය. (උදා: කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු යම් ප්‍රාදේශීය කාර්යාලයකට අනුයුක්ත කර ඇත්නම් ඔහුගේ ආකෘති පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධානී මගිනි.)

08. තැපැල් දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යෑමට අවශ්‍ය කාර්ය මණ්ඩල හැර ඡන්ද විමසීම් කටයුතු සඳහා පහසුවෙන් මුදාහැරිය හැකි සියලුම නිලධරයන් ලවා සම්පූර්ණ කරවන ලද ආකෘතිපත් නියමිත ආවරණ ලිපි සමඟ ඉදිරිපත් කළ යුතු අතර, පළාත් හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් ස්වකීය කාර්යාලයීය නිලධරයන්ගේ ආකෘති පත්‍රවලට අමතරව ආරෝග්‍යශාලා කාර්යය මණ්ඩලයන්හි ගණකාධිකරණ හා කළමනාකරණ ක්ෂේත්‍රවලට අයත් නොවන එනම් වෛද්‍ය/ හෙද/ පරිපූරක සේවාවල නිලධරයන් අතුරින් ඡන්ද විමසීම් රාජකාරී සඳහා පහසුවෙන් මුදාහැරිය හැකි සෙසු නිලධරයන් ලවා ද අදාළ ආකෘතිපත්‍ර සම්පූර්ණ කරවා නියමිත ආවරණ ලිපි සමඟ පහත ඡේද අංක 11 හි දැක්වෙන පරිදි අදාළ කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුවේ.

09. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ලෙස සේවයේ යෙදවීමට සුදුසුකම්ලත් නිලධරයන්ද ඇතුළු සියලුම සහකාර තේරීම්භාර නිලධාරි මට්ටමේ නිලධරයන් හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (පිරිමි) නිලධරයන් සඳහා වෙන වෙනම COPEC-F1 ආකෘතියෙන් ද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (කාන්තා) හා, කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා ලිපිකරු මට්ටමේ සේවයේ යෙදවීමට අපේක්ෂිත සියලුම නිලධාරීන් COPEC-F2 ආකෘතියෙන් ද ඒ ඒ නිලධර කාණ්ඩ සඳහා අදාළ පරිදි වෙන වෙනම වූ තොරතුරු සාරාංශ COPEC-F3 ආකෘතිය මගින් ද සම්පූර්ණ කිරීම මැනවි. එසේ වුවද, ඡන්ද විමසීම් රාජකාරිය සඳහා යෙදවීමට සුදුසුකම් ඇති නිලධරයන් අඩු සංඛ්‍යාවක් (14 ට අඩු) සේවයේ යෙදී සිටින ආයතනයන්හි ඒ ඒ ගණයන්ට අයත් නිලධරයන් වෙනුවෙන් වෙන වෙනම COPEC-F3 ආකෘති සම්පූර්ණ කිරීම වෙනුවට එක් ආකෘතියක සියලු තොරතුරු ඇතුළත් කිරීම ප්‍රමාණවත්ය. එනමුත් එම තොරතුරු, ARO (සහකාර තේරීම්භාර නිලධාරි), SPO (ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති), JPO (කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති), CL (ලිපිකරු) ලෙස වෙන වෙනම, ඒ ඒ පිළිවෙලින් ඇතුළත් කිරීම ඉතා වැදගත් වේ.

10. නිලධරයන් පිළිබඳ සංගණන ලැයිස්තු ඉදිරිපත් කිරීමේ වගකීම අදාළ ආයතන ප්‍රධානියා වෙත පැවරෙන අතර ඒ ඒ නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන COPEC-F1 හා COPEC-F2 ආකෘතිවල අංක 1 හි 1.1 සිට 1.8 සහ අංක 5 හි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව එකී ආකෘතිපත්‍ර සහතික කරන මාණ්ඩලික නිලධරයා විසින් පරීක්ෂා කර බලා සනාථ කර ගත යුතුය.

**11. දත්ත පත්‍ර (COPEC-F1 හා COPEC-F2) හා මූලික සංගණන සාරාංශ ලේඛන (COPEC-F3) එවිය යුතු ආකාරය**

**11.1 මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත එවිය යුතු දත්ත පත්‍ර හා සංගණන ලේඛන**

(අ) කොළඹ මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රජයේ කාර්යාල (රජයේ පාසල් මෙම කාණ්ඩයට ඇතුළත්ව නොමැත)

(ආ) ඉසුරුපාය, සෙත්සිරිපාය, සම්පත්පාය, ගොවිජන මන්දිරය, සුහුරුපාය ආදී කාර්යාල සංකීර්ණයන්හි පිහිටා ඇති සියලුම රජයේ කාර්යාල

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ පිහිටි කාර්යාල ඇතුළුව බත්තරමුල්ල තැපැල් බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු

(ඇ) ඉහත සඳහන් වර්ගීකරණයට අයත් නොවන නමුත් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි අනෙකුත් සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු (උදා: ජාතික ඒකාබද්ධතා සංහිඳියා හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය වැනි)

යන සියලුම කාර්යාලවල සේවයේ නියුතු සහකාර තේරීම්භාර නිලධාරි ගණයට අයත්වන [ARO (M) හා ARO (F)] සියලුම නිලධරයන්ගේ දත්ත පත්‍ර හා සංගණන ලේඛන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ගණයට අයත්වන [SPO (M)] පිරිමි නිලධරයන්ගේ දත්තපත්‍ර (COPEC-F1) හා සංගණන සාරාංශ ලේඛන (COPEC-F3) **මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය** ලිපිනය වෙත එවිය යුතුය. සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ දත්තපත්‍ර සම්පූර්ණ කිරීමේ දී නම, තනතුර හා සේවා ස්ථානය ඉංග්‍රීසි භාෂාවෙන් ද ලිවීම අත්‍යවශ්‍යය.

**11.2 කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත කර ඇති කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය වෙත එවිය යුතු දත්ත පත්‍ර හා සංගණන සාරාංශ ලේඛන**

(අ) ඉහත 11.1 හි සඳහන් කාර්යාලවල සෙසු නිලධරයන්ගේ [SPO(F), JPO/CL(M), JPO/CL(F)] දත්ත පත්‍ර (COPEC-F2) හා මූලික සංගණන සාරාංශ ලේඛන (COPEC - F3)

(ආ) ඉහත 11.1 හි සඳහන් නොවන, එහෙත් කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි සෙසු සියලුම රජයේ කාර්යාලවල (උදා: ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ දෙපාර්තමේන්තුවල උප කාර්යාල) සේවයේ නියුතු සියලුම නිලධරයන්ගේ [ARO(M/F), SPO(M/F), JPO/CL(M), JPO/CL(F)] දත්ත පත්‍ර (COPEC-F1, COPEC-F2) හා මූලික සංගණන සාරාංශ ලේඛන (COPEC-F3)

(ඇ) කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම රජයේ පාසල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන්/ විදුහල්පතිවරියන් හා ගුරුවරුන්/ ගුරුවරියන්ගේ දත්ත පත්‍ර (COPEC -F1, COPCE-F2) හා මූලික සංගණන සාරාංශ ලේඛන (COPEC -F3)

ඉහත දත්ත පත්‍ර හා මූලික සංගණන ලේඛන **"නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය, නිල මැදුර, ඇල්විටිගල පාර, කොළඹ 05"** යන ලිපිනය වෙත එවිය යුතුය.

**11.3 අනෙකුත් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත එවිය යුතු දත්ත පත්‍ර හා සංගණන සාරාංශ ලේඛන**

(අ) කොළඹ හැර අනෙකුත් දිස්ත්‍රික්කයන්හි පිහිටි සියලුම රජයේ කාර්යාලවල සේවයේ නියුතු සියලුම නිලධරයන්ගේ [ARO/SPO(M)/SPO(F), JPO/CL(M), JPO/CL(F)] දත්ත පත්‍ර (COPEC-F1 හා COPEC-F2) හා මූලික සංගණන සාරාංශ ලේඛන (COPEC-F3) ඒ ඒ දිස්ත්‍රික්කයන්හි නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දන්වා එවනු ලබන පරිදි ඒ ඒ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීන් වෙත හෝ මැතිවරණ කාර්යාලය වෙත යැවිය යුතුය.

(ආ) කොළඹ හැර අනෙකුත් දිස්ත්‍රික්කයන්හි පිහිටි සියලුම රජයේ පාසල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන්/ විදුහල්පතිවරියන්, ගුරුවරුන්/ ගුරුවරියන්ගේ දත්ත පත්‍ර (COPEC-F1, COPEC-F2) හා මූලික සංගණන සාරාංශ ලේඛන (COPEC-F3) ඒ ඒ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දන්වා එවනු ලබන පරිදි ඒ ඒ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත හෝ මැතිවරණ කාර්යාලය කඩිනමින් යැවිය යුතුය.

සටහන - **යම්කිසි කාර්යාලයක නිලධරයන්ගෙන් වැඩි පිරිසකගේ දත්ත පත්‍ර හා සංගණන ලේඛන ලැබී ඇති අවස්ථාවක දී සියලුම දත්ත පත්‍ර හා සංගණන ලේඛන එකතු වන තෙක් ඒවා රඳවා ගැනීමෙන් වැළකී සිටිය යුතු අතර, එතෙක් දත්ත පත්‍ර ලබා දී නොමැති නිලධරයන්ගේ දත්ත පත්‍ර පසුව වෙනම ආවරණ ලිපියක් සමඟ කඩිනමින් එවීමට යටත්ව එකතු කර ඇති ලේඛන අදාළ තේරීම්භාර නිලධාරී/ මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත එවීමට ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වා සිටිනු ලැබේ.**

12. ඒ ඒ නිලධරයන්ගේ තොරතුරු ලේඛනවලට ඇතුළත් කිරීමේදී මතු සඳහන් කාර්ය පරිපාටි විස්තරය අනුව ක්‍රියා කළ යුතුය.

කාර්ය පරිපාටිය

මෙහි නිලධරයන් වර්ග කිරීමේදී වැටුප් පියවරයන් ගණනය කර ඇත්තේ **2016.02.25** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **3/2016** හි උපලේඛන **I** හි සඳහන් වැටුප් තල පදනම් කරගෙනය.

**12.1** සහකාර තේරීම්භාර නිලධාරීන් :-;

- **ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයන් තෝරාගනු ලබන්නේ සහකාර තේරීම්භාර නිලධරයන් අතුරින් වන බැවින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයන් සඳහා විශේෂිත ආකෘති පත්‍රයක් නොමැති අතර, එම කාණ්ඩය යටතට ගැනෙන නිලධරයන් ද පහත පරිදි තොරතුරු ඉදිරිපත් කිරීම කළ යුතු වේ.**

** ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු ලෙස එක් වරක් හෝ කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු ලෙස දෙවරක්වත් හෝ ඡන්ද මධ්‍යස්ථානයක රාජකාරි ඉටුකර නැති කිසිම නිලධරයකු ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණ සහකාර තේරීම්භාර නිලධරයකු ලෙස පත් කරනු නොලැබේ.

*** සේවා අවශ්‍යතාව මත ඕනෑම සහකාර තේරීම්භාර නිලධරයකු ඡන්දපොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු ලෙස පත් කරනු ලැබීමට යටත්ය.

(I) රා.ප.ච. 3/2016 අනුව 47,615-10x1,335-8x1,630-17x2,170-110,895 වැටුප් පරිමාණයත් හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයත් හිමි දීප ව්‍යාප්ත සමාන්තර කළමනාකරණ සේවාවන්හි නිලධරයන්

* දීප ව්‍යාප්ත කළමනාකරණ සේවාවන්ට අයත් හෝ ඒ හා සමාන්තර සංවෘත සේවාවන්ට අයත් හෝ විධායක නිලධරයන් මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වලදී ඡන්ද මධ්‍යස්ථාන රාජකාරීන්හි නිරත වී ඒ පිළිබඳව පළපුරුද්දක් ලබා නොමැති නම් එවැනි නිලධාරීන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ඡන්ද මධ්‍යස්ථාන භාරව ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(II) රු. 41,580-11x755-18x1,030-68,425 වැටුප් පරිමාණයක් හිමි මාසිකව රු. 44,600/- ක් හෝ ඊට ඉහළ මාසික වැටුප් තලයක්ම හිමිකම් ලබන කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන් හා ඒ හා සමාන්තර සේවාවන්හි එවැනි නිලධරයන්

* කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිලධරයන් හා ඒ හා සමාන්තර සේවාවන්හි එවැනි නිලධරයන් මාසිකව රු. **44,600/-** ක් හෝ ඊට ඉහළ මාසික වැටුප් තලයකට හිමිකම් ලැබුවද මීට පෙර පැවති ඡන්ද විමසීම්වලදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ඡන්ද මධ්‍යස්ථාන භාරව රාජකාරිවල නිරත වී නොමැති නම් එවැනි නිලධරයන් ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණ සහකාර තේරීම්භාර නිලධාරීන් ලෙස පත්කිරීමට අපහසු බව කාරුණිකව සලකනු මැනවි. එබැවින් එවැනි නිලධරයන් මෙවර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ඡන්ද මධ්‍යස්ථාන භාරව ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

(III) රු.34,605-10x660-11x775-15x930-63460 හෝ රු.36585-10x660-11x755-15x930-65440 වැටුප් පරිමාණ හිමි රු.50,440/-ක් හෝ ඊට ඉහළ මාසික වැටුප් තලයකට හිමිකම් ලබන ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරීන් (බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍ය වන්නා වූ නිලධාරීන්)

(IV) විදුහල්පති සේවයේ පළමුවන පන්තියේ විදුහල්පතිවරුන්/ නියෝජ්‍ය විදුහල්පතිවරුන්

**12.2** ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් :-

(I) ඉහත 12.1 (II) හි රු.44,600/-ට අඩු මාසික වැටුප් තලයකට හිමිකම් ලබන නිලධරයන්

(II) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ හා ඒ හා සමාන්තර සේවාවල I වන පන්තියේ නිලධරයන්ට අදාළ රු.36,350-9x560-10x660-47,990 මාසික වැටුප් පරිමාණය හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි රු.37,470/- කට නොඅඩු මාසික වැටුප් තලයකට හිමිකම් ලබන නිලධරයන්

(III) රු. 37,470/- කට වැඩි දීමනා රහිත මාසික වැටුපක් ලබන ආශ්‍රිත නිලධාරීන් හා කාර්යාලගත/ ක්ෂේත්‍රගත නිලධාරීන් (බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍ය වන්නා වූ නිලධාරීන්)

(IV) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II වන පන්තියේ විදුහල්පතිවරුන්

(V) ශ්‍රී ලංකා ගුරු සේවයේ I වන පන්තියේ ගුරුවරුන්

සටහන(i) සහකාර තේරීම්භාර නිලධාරීන් ලෙස වර්ග කරනු ලබන මාණ්ඩලික නිලධාරීන්ගේ ගණයට අයත් නොවන, එහෙත් එම ගණයට අදාළ අවම මාසික වැටුපට වඩා වැඩි වැටුප් ලබන තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් හා විදුහල්පති සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ විදුහල්පතිවරුන් ඡන්ද විමසීමේදී ඡන්දපොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත් කරනු ලැබෙනු ඇති අතර ඡන්ද ගණන් කිරීමේදී අධීක්ෂණ මට්ටමේ තනතුරක් වූ වාහක නිලධාරීන් **(Transfer Officers)** ලෙස පත් කරනු ලැබීමට යෝජිතය.

සටහන(ii) රු. **37,470/-** ක් හෝ ඊට වැඩි මාසික වැටුප් තලයකට හිමිකම් ලබන නමුත්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් තිබිය යුතු කාර්යක්ෂමතාව සහ හැකියාව සහතික නොකෙරෙන, වෙනත් ක්ෂේත්‍රයන්ට අදාළ හැකියාවන් සහිත නිලධරයන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් ලෙස වර්ග නොකළ යුතු අතර, ඔවුන් ලවා කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන්ට අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ගත යුතුය.

සටහන(iii) ඉහත **II** හි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා යෝජිත වැටුප් තලයට (මාසික රු.**37,470/-**) වඩා අඩු වැටුප් තලයකට හිමිකම් ලබන නමුත් මෙයට පෙර ඡන්ද විමසීම්වලදී ඡන්ද මධ්‍යස්ථාන භාරව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස ක්‍රියාකර ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ **I** පන්තියේ (හෝ එයට සමාන්තර සේවාවල **I** පන්තියේ) නිලධරයන් සහ සංවෘත සේවාවල එවැනි තනතුරු දරන මාසිකව (දීමනා රහිතව) රු. **36,350/-** ක් ඉක්මවන වැටුප් තලයකට හිමිකම් ලබන නිලධරයන් සේවා අවශ්‍යතාව අනුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

සටහන(iv) බඳවා ගැනීමේ සුදුසුකම ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය අවශ්‍ය වන්නා වූ ආශ්‍රිත නිලධාරීන් හා කාර්යාලගත/ ක්ෂේත්‍රගත නිලධාරී තනතුරු දරන නිලධරයන් ඉහත සඳහන් රු. **37,470/-** ට අඩු හා එහෙත් රු. **35,050/-** හෝ එයට වැඩි මාසික වැටුප් තලයකට හිමිකම ලබන්නේ නම් හා එම නිලධරයන් මෙයට පෙර ඡන්ද විමසීම්වලදී එක්වරක් හෝ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ අවස්ථා තුනකදී කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ ඡන්ද මධ්‍යස්ථාන රාජකාරීන්හි නිරත වී ඇත්නම් එවැනි නිලධරයන් සේවා අවශ්‍යතා අනුව ඡන්ද මධ්‍යස්ථාන භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

සටහන(v) මෙයට පෙර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ ලිපිකරු තනතුරක හෝ ඡන්ද ගණන් කිරීමේ කටයුතු කර නැති ඉහත **12.2** හි **(I)** හා **(V)** ගණයට අයත් නිලධරයන් කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**12.3** කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් :-

I. ඉහත 12.2 සටහන (ii) අනුව කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස වර්ග කළ නිලධාරීන්

II. ඉහත 12.2 (II) යටතේ දැක්වෙන රු. 36,350-9x560-10x660-47,990/- හෝ එවැනි වැටුප් තලයක් හිමි එහෙත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම සඳහා අවශ්‍ය පළපුරුද්ද නොමැති නිලධරයන් සහ

III. මාසිකව රු. 37,470/- ට අඩු රු. 35,050/- හෝ එයට වැඩි වැටුප් තලයකට හිමිකම ලබන නමුත් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම සඳහා අවශ්‍ය පළපුරුද්ද නොමැති ආශ්‍රිත හා කාර්යාලගත/ ක්ෂේත්‍රගත නිලධාරීන් සහ මාසිකව රු.35,050/- ට අඩු වැටුප් තලයක් ලබන ආශ්‍රිත නිලධරයන්

IV. රු.32,290-18x350-38,590 වැටුප් පරිමාණයක් හෝ එයට ඉහළ වැටුප් පරිමාණයක් හිමි මාසිකව රු.32,290/- ක් හෝ ඊට වැඩි වැටුප තලයක් ලබන නිලධරයන්

V. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන පන්තියේ විදුහල්පතිවරුන්

VI. ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ I වන ශ්‍රේණියේ ගුරුවරුන්

සටහන (I) ඉහත 12.3 (V) හි සඳහන් විදුහල්පතිවරුන් මෙයට පෙර ඡන්ද විමසීම්වලදී එක්වරක් හෝ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ අවස්ථා දෙකකදී කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් හෝ ඡන්ද මධ්‍යස්ථාන රාජකාරීන්හි නිරත වී ඇත්නම් එවැනි නිලධරයන් සේවා අවශ්‍යතා අනුව ඡන්ද මධ්‍යස්ථාන භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ලෙස පත්කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

සටහන (II) තම හැකියාව හා පුහුණුව අනුව කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු වශයෙන් තිබිය යුතු කාර්යක්ෂමතාව සහතික නොකෙරෙන, වෙනත් ක්ෂේත්‍රයන්ට අදාළ හැකියාවන් සහිත නිලධරයන් ලවා ඡන්දපොළ ලිපිකරු නිලධරයන්ට අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කරවා ඉදිරිපත් කළ යුතුය.

**12.4 ලිපිකරුවන් :-**

I. ඉහත 12.3 හි සටහන (II) හි දැක්වෙන කාණ්ඩයට අයත් නිලධරයන් සහ
II. රු.28,940-18x300-34,340 වැටුප් පරිමාණයක් හෝ එයට ඉහළ වැටුප් පරිමාණයක් හිමි මාසිකව රු. 28,940 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන නිලධරයන්
III. ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ හා 3 වන පන්තියේ I වන (A,B,C) හා II වන ශ්‍රේණියේ ගුරුවරුන් සහ ආධුනික ගුරුවරුන්

සටහන :- ඉහත 12.4 (II) හි දැක්වෙන වැටුප් පරිමාණයට වඩා අඩු වැටුප් පරිමාණයක් (2016.02.25) දිනැති 3/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ MN – 1/2016 වැටුප් ක්‍රමය) හිමි පරිවාස කාලය ඉක්ම වූ රජයේ නිලධරයන් සේවා අවශ්‍යතාවක් ඇති වුවහොත් පමණක් ඡන්දපොළ ලිපිකරුවන් ලෙස සේවයේ යොදවා ගත හැකි බැවින් එවැනි නිලධරයන් ද දත්ත පත්‍ර සම්පූර්ණ කර එවිය යුතුය.

12.5 ශ්‍රී ලංකා ගුරු සේවයට හිමි වැටුප් පරිමාණයන්ට සමාන්තර වැටුප් පරිමාණයන්ට අනුකූලව වැටුප් ලබන පත්වීමේ ස්ථිර කර ඇති ගිහි පිරිවෙන් ගුරුවරුන්ටද අදාළ පරිදි මැතිවරණ රාජකාරි සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය.

12.6 කෙසේ වෙතත් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිලධාරීන් මැතිවරණ රාජකාරීන්හි යෙදවීමේ දී ඒ ඒ දිස්ත්‍රික්කයන්හි නිලධාරී අවශ්‍යතාවන් අනුව ඉහත කාර්ය පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීමට ඉඩ ඇතැයි යන්න ද සැලකිල්ලට ගත යුතුය.

**13. පොදු කරුණු :-**

13.1 නිලධරයකුගේ වැටුප පිළිබඳව තීරණය කිරීමේදී ඔහුට ගෙවන දීමනා සැලකිල්ලට නොගත යුතුය. 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන 1හි සඳහන් වැටුප් තලයක් පදනම් කරගත යුතුය.

13.2 COPEC-F3 සංගණන සාරාංශ ආකෘතිපත්‍ර ඉදිරිපත් කිරීමේදී, නිලධරයන්ගේ ආසන්නතම ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව නම් සටහන් කළ යුතු වේ. ආයතන හෝ පාසල් වෙනුවෙන් සංකේත අංකයක් සඳහන් කර ඇත්නම් එම ආකෘතිවල අදාළ ස්ථානයේ එම සංකේත අංකය සටහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

13.3 අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිදුකළ යුතු කාර්යයන් සඳහා තේරීම්භාර නිලධාරියාට හෝ පොලිසියට සහාය වීමට අවශ්‍ය වුවහොත් එසේ සහායවීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්

සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් තම තමන්ගේ කොට්ඨාස තුළ රැඳී සිටිය යුතු බැවින් ඔවුන් ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට ඇතුළත් කළ යුතු නොවේ.

13.4 තම නිල තත්ත්වය හේතුවෙන් ඡන්ද විමසීම් කාර්යයන් සඳහා පත් කරනු ලැබීමට සුදුසු නොවන අධිකරණ නිලධාරීන්, පොලිස් සේවයේ නිල ඇඳුම්ධාරීන් හෝ ග්‍රාම නිලධාරීන් ලවා මෙම ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමක් අපේක්ෂා නොකෙරේ.

13.5 ප්‍රාථමික ශ්‍රේණියට අදාළ කනිෂ්ඨ සේවකයන් වෙතින් මෙම COPEC-F1, COPEC-F2 හා COPEC-F3 ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමක් අපේක්ෂා නොකෙරේ. එහෙත් ඡන්ද විමසීම් මූලික කටයුතු සඳහා එම සේවකයන්ගේ සහාය ලබාදෙන ලෙස තේරීම්භාර නිලධාරීන් විසින් ඉල්ලා සිටින අවස්ථාවලදී ඔවුන් සේවයේ යෙදවීමට අවශ්‍ය කටයුතු කරන මෙන් ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**14. අදාළ දිස්ත්‍රික්කවල ආයතන ප්‍රධානීන්ගෙන් අවශ්‍ය වන වෙනත් උපකාර**

කාර්ය මණ්ඩලය සහ වාහන සපයාදීමට අමතරව මෙම ඡන්ද විමසීම් පැවැත්වීම පිළිබඳ වෙනත් යම් යම් කරුණුවලදී මැතිවරණ කොමිෂන් සභාවට සහ තේරීම්භාර නිලධාරීන්ට ඒ ඒ දිස්ත්‍රික්කවල සිටින ආයතන ප්‍රධානීන්ගේ සහාය අවශ්‍ය වන අවස්ථා ඇතිවිය හැක. එවැනි අවස්ථාවන්හිදී ඔබගේ සම්පූර්ණ සහයෝගය මැතිවරණ කාර්යය වෙනුවෙන් ලබා දෙන මෙන් ඉල්ලා සිටින අතර, ඔබ ආයතනයේ සියලුම නිලධරයන්ගේ සහය ලබා දෙන ලෙසට වූ උපදෙස් දෙන මෙන් ද ඉල්ලා සිටිමි.

**15.** මෙම චක්‍රලේඛය පිළිබඳව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සහ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ ඇති දිස්ත්‍රික්/ ප්‍රාදේශීය හා උප කාර්යාලයන්හි ප්‍රධානීන් දැනුවත් කිරීමට ක්‍රියා කරන ලෙස වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

**16.** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ104 ආ, 104 ඊ (1), (2), 104 උ සහ 104 උඋ ව්‍යවස්ථාවන්ගෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව

සටහන - (i) මෙම චක්‍රලේඛයේ පිටපත් ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් හා අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත ද මහබැංකු අධිපතිවරයා හා විගණකාධිපතිවරයා වෙත ද යැවේ.

(ii). මෙම චක්‍රලේඛය සම්බන්ධ වැඩිදුර තොරතුරු මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල් විමසීමෙන් ලබා ගත හැකිය (011-2868441-2-3).